
## රෝග නිවාරණයට, රෝගීන් රැකගැනීමට

# වෙළෙඳ නාමයෙන් ඖෂධ

එකම ඖෂධය වෙළෙඳ පොළේ විවිධ වෙළෙඳ නාමයන්ගෙන් තිබීමත් එම වෙළෙඳ නාමයන් ගේ මිළ ගණන් වෙනස් වීමත් නිසා වෛද්‍යවරුන් ඖෂධ නිර්දේශ කිරීමේ දී නිර්දේශ කළ යුත්තේ ඖෂධීය නාමයෙන් ද (Generic name)නැතහොත් වෙළෙඳ නාමයෙන් ද (Trade name) යන්න මතභේදයට තුඩුදුන් කරුණකි. මෙය අද ඊයේ පැනනැගුනක් නොව මීට දශක කිහිපයකට පෙර සිට කතාබහට ලක්වූවකි. ඒ නිසාම මේ ගැන මතුපිටින් බලා අත්තයක් ගන්නවා වෙනුවට තරමක් ගැඹුරින් කරුණු සොයා බැලීමට කැමැත්තෙමි. මුලින්ම අප මෙහි අවශ්‍යතාව ගැන සිතා බලමු.



අප සමාජයේ යම් කෙනෙකුට අසනීපයක් වූ විට වෛද්‍ය ප්‍රතිකාර ලබා ගත හැකි ක්‍රම කිහිපයක් තිබේ. ඒවා නම් නොමිලේ රජයේ රෝහලක බාහිර රෝගී අංශයෙන් ප්‍රතිකාර ලබා ගැනිම මුදල් ගෙවා පෞද්ගලික රෝහලකින් නේවාසිකව හෝ බාහිරව ප්‍රතිකාර ලබා ගැනීම, නැතහොත් රෝහලේ නේවාසිකව නොමිලේ එම ප්‍රතිකාර ලබා ගැනීම සාමාන්‍ය වෛද්‍යවරයකුගෙන් මුදල් ගෙවා ප්‍රතිකාර ලබා ගැනීම හෝ විශේෂඥ වෛද්‍යවරයකු ගෙන් මුදල් ගෙවා වෛද්‍ය උපදෙස් ලබාගෙන එම ඖෂධ මුදල් ගෙවා ෆාමසියකින් ලබා ගැනීම ආදි වශයෙන් ඒවා හඳුන්වාදිය හැකිය. මේ සෑම අවස්ථාවකදීම වාගේ සිදුවනුයේ වෛද්‍යවරයා විසින් නිර්දේශ කරන ලද ඖෂධ වට්ටෝරුව පෙන්වා එම ආයතනයේම පිහිටි බෙහෙත් දෙන ස්ථානයකින් හෝ පිටත ෆාමසියකින් ඖෂධ ලබා ගැනීමය.

මෙහිදී රජයේ රෝහල්වල වෛද්‍යවරු නිර්දේශ කරන බොහොමයක් ඖෂධ වට්ටෝරුවලට එම ආයතනයෙන්ම නොමිලේ ඖෂධ ලබා ගැනීමට හැකිවන නිසා එහිදී එම වෛද්‍යවරයා කුමන නාමයකින් ඖෂධය නිර්දේශ කළ ද ලබාදෙනුයේ රජයේ රෝහලේ බෙහෙත්ශාලාවේ ඇති ඖෂධ වර්ගයයි. එමෙන්ම බොහෝ දුරට වෛද්‍යවරුන්ගෙන් පෞද්ගලිකව ප්‍රතිකාර ලබාගැනීමේ දී ලබාදෙන බොහොමයක් ඖෂධ වට්ටෝරුවලට එම ආයතනයේ දීම ඖෂධ ලබාදෙන නිසා ඒ පිළිබඳ ගැටලුවක් ද පැන නොනගී.

නමුත් රජයේ රෝහල් බෙහෙත්ශාලාවල සමහර නව ඖෂධ වර්ග හිඟ කම නිසා එවැනි අවස්ථා වලදී පිටත ෆාමසියකින් ලබාගැනීමට ඖෂධ නිර්දේශ කරන අවස්ථා එමටය.

එමෙන්ම වෛද්‍යවරු පෞද්ගලිකව ප්‍රතිකාර කිරීමේ දී බොහොමයක් මිල වැඩි ඖෂධ පිටතින් ගැනීමට නිර්දේශ කරන අවස්ථා ද සුලබය.

**තමා ළඟට පැමිණෙන රෝගියාට ප්‍රතිකාර කිරීමේ දී ලබාදෙන ඖෂධය පිළිබඳ තීරණ ගැනීමේ පරම අයිතිය තිබෙන්නේ වෛද්‍යවරයාට පමණි. එය තවත් ඖෂධ සමාගමක නියෝජිතයකු හෝ ඖෂධ ලබාදෙන ඖෂධවේදියකු සතු අයිතියක් වත් වගකීමක් වත් නොවේ. ඒනිසා මෙහිදී කුමන නාමයෙන් ඖෂධ නිර්දේශ කරනවාද යන්න වෛද්‍යවරයකුට ඉතා වැදගත් කරුණක් වේ.**

ඉතින් මෙසේ රජයේ රෝහල් වලදී හා වෛද්‍යවරුන්ගෙන් පෞද්ගලිකව ප්‍රතිකාර ලබාගැනීමේ දී පිටතින් ගැනීමට ඩර්දේශ කරන ඖෂධ හා පෞද්ගලික රෝහල්වලදී මෙන්ම විශේෂඥ වෛද්‍ය උපදෙස් ලබාගන්නා සෑම අවස්ථාවකදීම නිර්දේශ කරන ඖෂධ වට්ටෝරුවල ඖෂධ ඖෂධීය නාමයෙන් ලියන්නේද වෙළෙඳ නාමයෙන් ලියන්නේ ද යන්න අද මතභේදයට තුඩු දී ඇති කරුණ වී තිබෙන්නේ එකම ඖෂධය විවිධ නම්වලින් විවිධ මිල ගණන්වලට වෙළෙඳ පොළේ තිබීමයි.

එකම ඖෂධය වෙළෙඳ පොළේ විවිධ නම් වලින් තිබෙන බවත්, එම එකම ඖෂධය (විවිධ වර්ණයෙන් විවිධ ඇසුරුම්වල අසුරා විවිධ වූ මිල ගණන්වලට විකිණීමට ඇති බව නොරහසකි. මෙය අප වැනි විවෘත ආර්ථික රටාවක් අනුගමනය කරන රටවලට පොදුවූ ලක්‍ෂණයකි. මෙහිදී විශේෂයෙන්ම ඇසුරුම කිරීමේ දී ඖෂධයෙහි කල් පැවැත්මට එය කෙළින්ම බලපායි. උදාහරණයක් ලෙස සාමාන්‍ය ප්ලාස්ටික් බෝතලයක පොලිතින් බෑගයක බහාලන ලද ඖෂධ පෙති කරල් 500 ක 1000 ක ඇසුරුමකට වඩා වෙන වෙනම ආරක්‍ෂක ඇසුරුම්වල පෙති / කරල් 5 , 10 බැගින් අසුරා ලේ බල් කර (ඖෂධීය නාමය, වෙළෙඳ නාමය හා කල් ඉකුත් වීමේ දිනය ද ඇතුළුව) වෙන වෙනම පැකැට්ටු වල බහා එයද වෙන වෙනම ලේබල් කර තිබෙන ඖෂධ ඇත. මේවා පහසුවෙන් ළඟ තබාගැනීමේ හැකියාවත්, ඖෂධය පරිභෝජනයට ගන්නා අවස්ථාව දක්වා වායුගෝලයට නිරාවරණය නොවීමත් නිසා වායුගෝලයේ තෙතමනය මගින් හා වෙනත් හේතු මගින් එම ඖෂධයට සිදුවන හානිය සැලකිය යුතු ලෙස අඩුවන අතර අවශ්‍ය අවස්ථාවලදී පාවිච්චිය සඳහා පහසුවෙන් එහා මෙහා රැගෙන යාමේ හැකියාවද ඇත. තවද එකම ඖෂධය කරල්, පෙති දියර සහ බිංදු වශයෙන් තිබීම නිසා ඒ ඒ අවස්ථාවලදී පාවිච්චිය පහසු වී ඇත.

ඖෂධ නිෂ්පාදනයේ දී තවත් වැදගත් කරුණක් වනුයේ එහි නිෂ්පාදිත තත්ත්වය පවත්වාගෙන යාමයි. මේ සඳහා අමතර මුදලක් වැයවන බව නොරහසකි. බොහොමයක් ඖෂධ සමාගම් මේ සඳහා විශේෂ අවධානය යොමු කරන අතර ඔවුන් තම සමාගම මගින් නිපදවන ඖෂධවල තත්ත්වය පවත්වාගෙන යාම සඳහා විශාල මුදලක් වැය කරයි. එය ඔවුනට අපහසු කාර්යයක් නොවනුයේ එම ඖෂධ වැඩි මිලට විකිණීමට හැකි වීමත් ඔවුන්ගේ නිෂ්පාදන සඳහා ඇති විශ්වාසය පලුදු නොවීමත් නිසාය.

එද 1971 දී මහාචාර්ය සේනක බිබිලේ නම් වූ මානව හිතවාදියා ගේ මූලිකත්වයෙන් ආරම්භ කරන ලද රාජ්‍ය ඖෂධ සංස්ථාවේත්, ජාතික ඖෂධ ප්‍රතිපත්තියකත් අවශ්‍යතාව අද එදට වඩා බෙහෙවින් දැනෙනුයේ අද පවතින්නේ එවකට තිබූ ආර්ථික රටාව නොව විවෘත ආර්ථික රටාවක් වන නිසාය. මෙහි දී විවිධ නම්වලින් වූ ඖෂධ වර්ග වෙළෙඳ පොළට පැමිණීම වැළැක්විය නොහැකිය. එහෙත් ඒවායේ තත්ත්වය පිළිබඳ සහතිකයක් මෙන්ම මිල පාලනයක් සාදචාර විරෝධී ලෙස යම් ඖෂධ විකුණා ගැනීම සඳහා සිදුකරන පෙලඹවීම් (Unethical Drug Pramotion) පාලනය කිරීම එය වගකීමයි. මක්නිසාදයත් මෙම විවෘත ආර්ථික ක්‍රමයේ වෙළෙඳ පොළ විවිධාංගිකරණය තුළ සමාජ ව්‍යුහය, පුද්ගල සිතුම් පැතුම් උවමනා එපාකම් වෙනස් වී තිබීමයි.

තමා ළඟට පැමිණෙන රෝගියාට ප්‍රතිකාර කිරීමේ දී ලබාදෙන ඖෂධය පිළිබඳ තීරණ ගැනීමේ පරම අයිතිය තිබෙන්නේ වෛද්‍යවරයාට පමණි. එය තවත් ඖෂධ සමාගමක නියෝජිතයකු හෝ ඖෂධ ලබාදෙන ඖෂධවේදියකු සතු අයිතියක් වත් වගකීමක් වත් නොවේ. ඒනිසා මෙහිදී කුමන නාමයෙන් ඖෂධ නිර්දේශ කරනවාද යන්න වෛද්‍යවරයකුට ඉතා වැදගත් කරුණක් වේ. මෙහිදී ඇතැමුන් කියන පරිදි ඖෂධීය නාමයෙන් ඖෂධ නිර්දේශ කළ විට එම ඖෂධය අඩංගු ඕනෑම වෙළෙඳ නාමයකින් ඇති ඖෂධයක්, ඖෂධවේදියා විසින් තීරණය කර ලබාදිය හැකිය. එහිදී එම ඖෂධවේදියා ප්‍රියකරන වෙළෙඳ නාමයකින් ඇති ඖෂධයක් මෙන්ම, ඔහුට වැඩි ලාභයක් ලැබෙන මිල වැඩි වෙළෙඳ නාමයක ඖෂධයක් ලබාදීමට හෝ මිල මට්ටම කුමක් වුවත් එම ආයතනයේ ඇති කුමක් හෝ වෙළෙඳ නාමයකින් ඇති ඖෂධයක් ලබා දෙයි.

මෙම අවස්ථාවේ දී ඖෂධය ලබාගන්නා තැනැත්තාට මිලෙන් අඩු ඖෂධ ඉල්ලා සිටිය හැකි වුවත්, එහි දී ඖෂධවේදියාට එම ඉල්ලීම කිහිප ආකාරයකින් පැහැර හැරිය හැකියන මෙය මා අත්දැකීමෙන් දන්නා කරුණක් වන අතර එසේ ඉල්ලා සිටීමට තරම් අප සමාජය දැනුවත් වීද නැත. තවද එසේ ඉල්ලා සිටීම මදි පුංචිකමක් ලෙස සමහරු සිතන අවස්ථා ද එමටය.

අනෙක් අතට මා පෙර සඳහන් කළ ආකාරයට මුදලට වෛද්‍ය ප්‍රතිකාර ලබාගැනීමට අවශ්‍ය වනුයේ කුමන තාරාතිරමක පුද්ගලයන්ට ද යන්න සිතා බැලිය යුතුය. මින් වැඩිමනක් දෙනා මධ්‍යම පාන්තිකයන් හා ධනවතුන් බව පැහැදිලිය. මොවුන් විශේෂයෙන්ම ප්‍රමාදයට අකමැති කාර්යය බහුල වූවත් නිසාම, ඔවුන්ගේ ආර්ථික සමාජීය තත්ත්වයට, ජීවන රටාවට, බුද්ධි මට්ටමට ගැලපෙන ප්‍රමිතිය ගැන සෑහීමකට පත්විය හැකි ඖෂධයක් එය වෙළෙඳ නාමයෙන් නිර්දේශ කිරීම වෛද්‍යවරයකු සතු වගකීමකි. එය නිසිආකාරව කිරීමට සුදුසු එකම පුද්ගලයා ද වෛද්‍යවරයාය. ඒ කුමක් නිසාද, ඒ සඳහා දැනගතයුතු රෝගියා ගේ සාමාජීය, ආර්ථික හා වෙනත් බොහොමයක් කරුණු රෝගනිධානයක් සමඟ ලබාගන්නා තොරතුරුවලින් වෛද්‍යවරයා විසින් ලබාගෙන සිටීමයි. එහෙත් වෛද්‍යවරයා විසින් ඖෂධීය නාමයෙන් ඖෂධ නිර්දේශ කළ හොත් සිදුවන්නේ එම වගකීම රෝගියා පිළිබඳ කිසිදු තොරතුරක් නොදන්නා ඖෂධවේදියාට පවරා දීමයි.

තත්ත්වය මෙසේ වුවත්, තමා ළඟට පැමිණෙන රෝගියා කුමන තාරාතිරමක අයෙක් වුවද මිල අධික එකම වෙළෙඳ නාමයකින් යුත් ඖෂධ හා අවශ්‍යතාවත් වඩා ඖෂධ වර්ග නිර්දේශ කරමින් යම් යම් සමාගම් සතුටු කරමින් ඔවුන්ගෙන් ලක්‍ෂගණනින් මුදල් සත්තෝසමක් විදේශ සංචාරයක් තම දුවට පුතාට පරිගණකයක් ලබා ගැනීමට මානබලන සාමාන්‍ය වෛද්‍යවරු මෙන්ම විශේෂඥ වෛද්‍යවරු ද මෙරටේ සිටින අවස්ථා මා දැක තිබේ. එහෙත් මා කතාකරනුයේ එවැනි අන්තයක් ගැන නොව, රෝගියා ගේ දුක තේරෙන රෝගියා ගේ ඕනෑ එපාකම් හඳුනා ඔවුන් ගේ ආර්ථික සාමාජීය තත්ත්වය හා කාර්යය බහුලත්වය අවබෝධ කර ගනිමින් ප්‍රතිකාර කරන වෛද්‍යවරුන් ගැනයි. එසේම තමා ළඟට පැමිණෙන රෝගියා ගේ අග හිඟකම් හඳුනා ගනිමින් තමාට ලැබී ඇති නිදර්ශක ඖෂධ පවා නොමිලේ ලබා දෙමින් හා නොයෙකුත් ආකාරයේ ආර්ථිකමය උදවු උපකාර කරමින් තම රෝගියා සුවපත් කර ගැනීමට වෙහෙසන වෛද්‍ය උතුමන්ලා ද මේ රටේ සිටින බව අමතක නොකළ යුතුය. ඔවුන් බොහොමයක් දෙනා පුරාණයේ සිට පැවත එන අපේ සිංහල වෛද්‍ය ක්‍රමයේ ගුණාංගත් බුද්ධ දහමින් පෝෂණය වූ අපේ සංස්කෘතික ගති ලක්‍ෂණත් යන මෙවායේ ආභාෂයෙන් බිහිවූවන් ය. ❑

වෛද්‍ය
**සමන් කුමාර දිසානායක**